**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

# රාජ්‍ය සංගීත කණ්ඩායමේ සංගීත ශිල්පී තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

01. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සංගීත කණ්ඩායමේ පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත දැක්වෙන සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් 2020.10.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

    එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් එවිය යුතුය.

04. මෙම තනතුර සඳහා අයදුම්පත් එවීමේදී, අයදුම් කරනු ලබන තනතුර "සංගීත ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. අයදුම්පත් පිරවීමේදී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතුය.

06. සේවයේ නියුක්ත කරවීම සහ සේවා කොන්දේසි :

    i. කොන්ත්‍රාත් පදනමින් පත් කරනු ලබන අතර, වසර 03 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත් කෙරේ.

    ii. වැටුප රු.33,600/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

    I. අධ්‍යාපන සුදුසුකම් :

    අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී සංගීත විෂය ඇතුළුව විෂයන් තුන (03) කින් සමත් වීම.

    **හා**

    ජාතික සංගීත අවසාන විභාගය සමත්වීම හෝ භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය සමත්වීම.

    **හෝ**

    විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සංගීත විෂය සම්බන්ධව උපාධියක් ලබා තිබීම

    II. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

    (යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

    III. පළපුරුද්ද :

    රජය විසින් පිළිගත් කලායතනයක හෝ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ඊට සමාන ආයතනයක් වශයෙන් පිළිගනු ලබන කලායතනයක සංගීත ශිල්පියෙකු වශයෙන් වසර 05ක පළපුරුද්ද

    **හෝ**

    පාරම්පරික සංගීත ශිල්පියකු වීම. (ලිඛිතව සනාථ කළ යුතුය)

    IV. කායික සුදුසුකම් :

    i. සෑම අපේක්ෂකයෙකුම තනතුරෙහි රාජකාරි ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

    ii. උස අඩි 5 යි අඟල් 3 කට නො අඩු විය යුතුය.

    V. වෙනත් සුදුසුකම් :

    i. සියලුම අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

    ii. තනතුරට බඳවාගැනීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

    iii. ගායන / වාදන සියලුම අංශවල ප්‍රවීණතාවය සලකනු ලැබේ.

08. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

09. බඳවා ගැනීමේ ක්‍රමය :

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා භාජනය කරන අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. අදාළ ක්ෂේත්‍ර තුළ ලබා ඇති පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය ) | 35 | |
| 3. වෘත්තීය සුදුසුකම්<br>i. ප්‍රවීණ ශිල්පීන් යටතේ ජාතික තලයේ නිර්මාණවලට සහභාගී වී තිබීම.<br>ii. සංස්කෘතික මධ්‍යස්ථාන මගින් හෝ ප්‍රවීණ ශිල්පීන් සමඟින් විදේශ ප්‍රසංගවලට සහභාගී වී තිබීම | 25 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

**වෘත්තීය පරීක්ෂණය**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ප්‍රධාන විෂය (ගායනය/වාදනය) | 60 | 30 |
| 2. අනු විෂය (ගායන ශිල්පීන් සඳහා වාදන / වාදන ශිල්පීන් සඳහා ගායනය) | 20 | 10 |
| 3. ස්වර ප්‍රස්ථාර කියවීමේ/ ලිවීමේ හැකියාව | 20 | 10 |
| එකතුව | 100 | 50 |

**අධ්‍යක්ෂ,**
**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,**
**08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල**
**2020.09.20**

## ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංගීත ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා ඉල්ලුම් කිරීම**

01. මුලකුරු සමග නම : ..........
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ..........
03. උපන් දිනය : ..........
04. වයස (2020.10.09 දිනට) : ..........
05. උස : අඩි .......... අඟල් ..........
06. ජාතික හැඳුනුම්පත් අංකය : ..........
07. ස්ත්‍රී / පුරුෂ භාවය : ..........
08. ලිපිනය : ..........
09. දුරකථන අංකය : ..........
10. අධ්‍යාපන සුදුසුකකම් : ..........

    i. අ.පො.ස. (උ/පෙළ)

    වර්ෂය : විභාග අංකය :

| විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

    ii. ලබාගත් උපාධිය : ..........

| වලංගු වන දිනය | ක්ෂේත්‍රය | ආයතනය / විශ්වවිද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

    iii. ජාතික සංගීත අවසාන විභාගය / භාත්ඛණ්ඩේ විද්‍යා පීඨයේ සංගීත විශාරද විභාගය

| වලංගු වන දිනය | සමත් විභාගය | ආයතනය / විශ්වවිද්‍යාලය |
|---|---|---|
| | | |
| | | |

11. වෘත්තීය සුදුසුකම් : ..........
12. පළපුරුද්ද : ..........

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවද, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

දිනය : .......... අයදුම්කරුගේ අත්සන : ..........

Source: Silumina, Sunday Observer (2020.09.20)